ශීර්ෂය 110 - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 110 - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත්කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ව්‍යාපෘති කටයුතු අවසන් වී තැන්පතු මුදල් නිදහස් කිරීමට හැකි රඳවුම් මුදල් තැන්පතු 6ක රු.9,690,402ක් මුදල් නිදහස්කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කටයුතුකර නොතිබුණු අතර, එම වටිනාකම පොදු තැන්පතු ගිණුමේ තවදුරටත් රඳවාගෙන තිබුණි.	ඉදිරියේ දී රඳවුම් මුදල් නිදහස් කිරීමට නියමිත බව දන්වා තිබුණි.	නියමිත පරිදි රඳවුම් මුදල් නිදහස්කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර මුද්‍රිත SA-10 අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මිලදීගැනීම් වටිනාකම රු.6,763,417ක් වුව ද, භාණ්ඩාගාර මුද්‍රිත SA-82 අනුව එහි වටිනාකම රු.6,526,162ක් වූයෙන් රු.237,255ක් අඩුවෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත්කර තිබුණි.	2024.12.31 දිනට SA-10 අනුව වත්කම් මිලදීගැනීම් රු.6,763,417ක් වන අතර, එහි අධිකරණ අමාත්‍යාංශය විසින් වත්කම් මිලදීගැනීම වෙනුවෙන් දරන ලද වියදම රු.6,526,162ක් වේ. අනෙකුත් වත්කම් මිලදීගැනීම වන රු.237,255ට අදාළ වනුයේ අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත වැය විෂය අංක 110-1-5-2102 යටතේ වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ලබා දී ඇති ප්‍රතිපාදනවලින් වියදම වේ. අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම්	මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව වටිනාකම සටහන් කළ යුතු ය.

	කාර්යාලයන්හි අනුයුක්ත වී ඇති ඒකාබද්ධතා නිලධාරින්ට අවශ්‍ය කාර්යාල උපකරණ මිලදීගැනීම වැය විෂය අංක 110-1-5-2102 යටතේ සිදුකරන අතර, එම වත්කම් මිලදීගැනීම සඳහා ප්‍රසම්පාදන කාර්යයන් හා ගිණුම් තැබීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සිදුකරනු ලබයි. එහි දී වත්කම් ප්‍රාග්ධනිත කිරීමක් සිදුව නොමැති හෙයින්, 2025 වර්ෂයේ දී අදාළ ප්‍රාග්ධනිත කිරීම් අමාත්‍යාංශය මගින් ඉටුකිරීමෙන් මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි.	

(ඇ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත්කර නොතිබුණි.

නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 03ක් සඳහා ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරා දී ඊට අදාළව රු.46,990,768ක වියදම් සිදුකර තිබුණ ද, එම වියදම් තහවුරු කිරීමට අදාළ වියදම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවී ය.	විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති පරිදි, වැය විෂයන් 3ට අදාළව ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරා දී ඊට අදාළ වියදම එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් දරා භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් මගින් ගිණුම්ගත කරනු ලැබේ. එකී වියදම්වලට අදාළ වවුචර්පත් වියදම දරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින බව සඳහන් කරමි.	පවරාදුන් ප්‍රතිපාදනවලින් අදාළ අරමුණු ඉටුකර ගෙන ඇති ද, යන බවට සනාථකර ගැනීමට වියදම් වාර්තා ලබාගත යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයන් 14කට හා මූලධන වැය විෂයන් 16කට අදාළව ප්‍රතිපාදනවල එකතුව රු.3,148,260,000ක් සම්පූර්ණයෙන්ම වැයනොකර ඉතිරි වී තිබුණි.	අමාත්‍යවරයා 2024 ජූලි 31 ඉල්ලා අස්වීම හේතුවෙන් අමාත්‍ය කාර්යාලයට අයත් වැය ශීර්ෂ ඉතුරුවීම්, ව්‍යාපෘතිවලට අදාළව, අදාළ ආයතනය සෘජුව වියදම් දැරීම හා වියදම් ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම්කර නොතිබීම, සමථ මණ්ඩලය සඳහා වෙන්කළ ප්‍රතිපාදනවලට අදාළ වියදම් අමාත්‍යාංශය මගින් දැරීම, අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම මත ප්‍රතිපාදන වැය නොවූ බව දක්වා තිබුණි.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ආ)	වැය විෂයන් 04කට අදාළව මුදල් රෙගුලාසි 66 මගින් එකතුව රු.3,375,000ක ප්‍රතිපාදන මාරුකර තිබුණ ද, එම මාරුකරන ලද ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.	ප්‍රතිපත්තිමය තීරණ, නිසිවේලාවට අක්මුදල් නොලැබීම අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම මත මාරුකරන ලද ප්‍රතිපාදනය ඉතුරු වූ බව දන්වා තිබුණි.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රතිපාදන මාරුකිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	110-1-1-0-1003-0/11 වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.1,880,000ක මුදලක් වෙන්කර ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට එසේ වෙන්කරන ලද වටිනාකම සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණු අතර, එම වැය විෂයේ ප්‍රතිපාදනවල මුළු ඉතිරිය රු.2,393,369ක් විය.	110-1-1-0-1003-0/11 වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ලැබුයේ වැඩි වූ ජීවන වියදම් දීමනාව සඳහා වූ අතිරේක වැය දැරීම් සඳහා වේ. නමුත් 2024 වසරේ මැද භාගයේ දී ගරු අමාත්‍යතුමාගේ මෙන්ම එම කාර්යමණ්ඩලයේ ඉල්ලා අස්වීම හේතුකොට ගෙන අපේක්ෂිත පරිදි වියදම් දැරීමක් අවශ්‍ය නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදුවිය.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන පරිපූරක ලබාගත යුතු ය.
(ඈ)	පුනරාවර්තන වැය විෂයන් 21ක සහ මූලධන වැය විෂයන් 11ක ප්‍රතිපාදිත රු.2,326,071,250කින් රු.1,406,807,233ක් ඉතිරි වී තිබූ අතර, එය සියයට 16 සිට 98ක පරාසයක් දක්වා විහිදී තිබුණි.	අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වියදම් සීමා වීම, අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම, අපේක්ෂිත ව්‍යාපෘති සඳහා අනුමැතීන් නොලැබීම, බදු ප්‍රතිපූරණය කිරීමට ඉල්ලීම් නොකිරීම, මැතිවරණ කාලසීමාව තුළ වැඩසටහන් පැවැත්වීමට නොහැකි	සැලසුම් කළ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටුකළ යුතු ය.

		වීම යන කරුණු හේතු වූ බව දන්වා තිබුණි.	
(ඉ)	110-1-2-24-2509-17 වැය විෂය එනම් ශ්‍රී ලංකා අධිකරණ ක්ෂේත්‍රය සඳහා සහයෝගය දැක්වීමේ ප්‍රගතිය වෙනුවෙන් රු.19,490,000ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, 2024 ජුනි මස අන්තර්ජාල පහසුකම් ලබාගැනීම වෙනුවෙන් වැටිබදු වියදම වන රු.224,796ක් පමණක් මෙම වැය විෂය යටතේ වැයකර තිබුණි.	Support to Justice Sector ව්‍යාපෘතිය සඳහා 110-01-02-024-2509 හා 110-01-02-034-2509 ලෙස වැය විෂයන් දෙකක් වෙන්කර ඇත. උක්ත කරුණ මගින් දක්වා ඇති වැය විෂය යටතේ ව්‍යාපෘතිය සිදුකරන අතර, අමාත්‍යාංශයට ලබාදෙන ලද මූල්‍ය ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද වියදම් ගිණුම්ගත කළ අතර, 110-01-02-034-2509 වැය විෂය මෙම අමාත්‍යාංශයේ ඉල්ලීමකින් තොරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඇතුළත් කරන ලද්දකි.	අවශ්‍යතාවයන් හඳුනාගෙන සැලසුම් කිරීම හා සැලසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

3.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

නිරීක්ෂණය		**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**		
2018 ජනවාරි 24 දිනැති අංක 5/2018(I) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 5/2008 දරන චක්‍රලේඛය	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙලකර නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	2025 අගෝස්තු අවසන්වීමට පෙර අභ්‍යන්තර කටයුතු ඒකකය මගින් සකස්කරන බව දක්වා ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටුනොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධිකරණ අංශයට සහාය දැක්වීමේ ව්‍යාපෘතියෙන් (SJSP) රුපියල් මිලියන 15ක අරමුදල් උපයෝගී කරගෙන ප්‍රාදේශීය පුහුණු වැඩසටහන් මගින් නිලධාරින් 3000ක් පුහුණු කිරීමට සැලසුම්කර තිබුණ ද, අරමුදල් නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මකකර නොතිබුණි.	රජය මගින් ලබාදෙන අරමුදල් සහ Support to Justice Sector ව්‍යාපෘතිය මගින් ලබාගන්නා පහසුකම් භාවිතා කරමින් අධිකරණවල සේවයේ නියුතු නිලධාරින් 3000ක් පමණ ආවරණය වන සේ 2024 වර්ෂය තුළදී කලාපීය (ප්‍රාදේශීය) පුහුණු වැඩසටහන් 06ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණි. නමුත්, 2024 වර්ෂය සඳහා Support to Justice Sector ව්‍යාපෘතිය යටතේ කලාපීය පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් නොලැබුණු අතර, ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 යටතේ ඇති විධිවිධානවලට අනුකූලව එකී වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සපයාගැනීමට දුෂ්කර වීම හේතුවෙන් කලාපීය පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.	නිසිඅධ්‍යනයකින් සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ගිණුම්කරණ පුහුණු වැඩසටහන සඳහා රු.300,000ක් ඇස්තමේන්තු කළ අතර, මෙමගින් නිලධාරින් 250කට ආසන්න ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුහුණුකර අවසන් කිරීමට නියමිත වුව ද, මෙම වැඩසටහන ආරම්භකර නොතිබුණි.	පුහුණුකිරීමේ ආයතනය නැවතත් වෙනත් ස්ථානයකට රැගෙන යාමට අමාත්‍යාංශය විසින් තීරණයකර ඇති බැවින්, පරිගණක විද්‍යාගාරය ජාලගත කිරීම සහ ඒ සඳහා අන්තර්ජාල පහසුකම් සපයාගැනීමට නොහැකිවීම මත පරිගණක විද්‍යාගාරය ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගැනීමට නොහැකි වූ බැවින්, පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වූ බව දක්වා තිබුණි.	සැලසුම් කළ කාර්යයන් නිසිපරිදි ක්‍රියාත්මක කළ යුතු ය.

(ඇ)	ජාතික ඒකාබද්ධතා අංශය යටතේ ක්‍රියාත්මක වන සහජීවන සංගම් පිහිටුවීම හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා (110-1-5-14-2509) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22ක් සඳහා රු.584,075ක ලබා දී තිබූ ප්‍රතිපාදන වැයකර නොතිබුණි.	සහජීවන සංගම් පිහිටුවීම හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වෙන්කරන ලද රුපියල් මිලියන 2ක ප්‍රතිපාදන මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 15ක් වෙත ප්‍රතිපාදන රු.1,962,144ක් නිදහස්කර ඇත. එසේ වුව ද, 3වන හා 4වන කාර්තු දෙක ඇතුළත ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත් වූ කාලසීමාවේ දී සහජීවන සංගම් ස්ථාපිත කිරීම වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මැතිවරණ නීති මගින් වළක්වා තිබීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස්කරන ලද රු.584,075ක ප්‍රතිපාදන ආපසු එවා ඇත.	සැලසුම්කළ කාර්යයන් නිසිපරිදි ක්‍රියාත්මක කළ යුතු ය.
(ඈ)	2016 මාර්තු 29 දින සහ 2023 ජුනි 09 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාව මගින් ලබාදෙන ලද නියෝග ප්‍රකාරව 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනත වෙනුවට නව පනතක් සකස්කිරීමේ කටයුතු ද 2024 දෙසැම්බර් 31 දින දක්වා අවසන්කර නොතිබුණි.	බන්ධනාගාර ආඥාපනත සංශෝධනය සම්බන්ධව නිර්දේශ නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍යාංශයට යොමුකර ඇති අතර, එම නිර්දේශ සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ යෝජනා හා නිර්දේශ තවදුරටත් මෙම අමාත්‍යාංශය මගින් අධ්‍යනය කරමින් පවතින බවත්, 2025 දෙසැම්බර් වන විට පාර්ලිමේන්තුව ඉදිරිපත් කිරීමට සැලසුම්කර ඇති බව දක්වා තිබුණි.	රාජ්‍ය ගිණුම්කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමට පියවරගත යුතු ය.

4.2 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමථකරණ නිලධාරින් සඳහා සමාලෝචිත වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම්කර තිබූ මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 203ක් වූ අතර, වර්ෂය තුළ දී රජයේ ප්‍රතිපාදන මගින් හා SEDR ව්‍යාපෘතිය යටතේ සිදුකර ඇති මුළු වැඩසටහන් ප්‍රමාණය 40ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 19ක් වැනි අවම මට්ටමක පැවතුණි.	ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් සැලැස්ම අනුව පුහුණු වැඩසටහනක් පැවැත්වීමට නොහැකි වූ බව දන්වා ඇත.	නිසිඅධ්‍යයනයකින් පසු සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	Fabrication of Record room racks for the court of Appeal රුපියල් මිලියන 15.7කට පෞද්ගලික ආයතනයක් වෙත 2024 ඔක්තෝබර් 23 වන දින ප්‍රදානයකර තිබුණ ද, අදාළ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගිවිසුම් ගතවී තිබුණේ 2024 නොවැම්බර් 22 වන අතර, ඒ සඳහා මාසයකට ආසන්න කාලයක් ගතකර තිබුණි. මෙම වාර්තාවේ දින දක්වා අදාළ කාර්යය නිමකර නොතිබුණි.	කාර්යසාධන ඇපකරය තහවුරුකර ගැනීමේ ප්‍රමාදය මත ගිවිසුම්ගත වීම ප්‍රමාද වූ බවත්, කොන්ත්‍රාත් ආයතනය රාක්ක සපයා දී තිබුණ ද, ඉඩකඩ සීමිත බැවින් රාක්ක සවි කිරීමට ප්‍රමාද වූ බවත් දන්වා තිබුණි.	ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ)	දිවුරුම් කොමසාරිස්, හදිසි මරණ පරීක්ෂක, සාමදාන විනිසුරු හා දිවුරුම් දුන් භාෂා පරිවර්තක තනතුරු සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමේ කාර්යය මාස 03ක් ඇතුළත රු.20,095,000කට නිමකිරීමට 2024 ජුනි 19 දින තෝරාගත් කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම්ගත වී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසාන වන තෙක් කාර්යය නිමකර නොතිබුණි.	පද්ධතිය ස්ථාපනය කිරීමේ මොඩියුල ලෙස සංවර්ධනය කරනු ලබන අතර, ඉන් 04ක් අවසන්කර ඇති අතර, UNDP ආයතනය මගින් ප්‍රතිපාදන ප්‍රමාදවීම මත කාර්යය නිමකිරීමේ කාලය දීර්ඝකර ඇති බව දක්වා තිබුණි.	ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතු ය.

4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධිකරණ නිලධාරින් පුහුණු කිරීමේ ඒකකයේ ක්‍රියාකාරකමක් වන පරිගණක පුහුණු වැඩසටහන් සිදුකිරීම වර්ෂය තුළ ආරම්භකර නොතිබුණු අතර, පරිගණක ඒකකය ද ක්‍රියාත්මක තත්ත්වයේ	අධිකරණමය නොවන නිලධාරින් පුහුණුකිරීමේ ආයතනය වරින්වර ස්ථාන කිහිපයකට ගෙනයාමට සිදුවීම හේතුවෙන් විගණන නිරීක්ෂණයේ සඳහන් පරිගණක උපාංග නිශ්කාර්යව පවතී. මෙම	සැලසුම්කළ පරිදි කාර්යයන් ඉටුකළ යුතු අතර, උපකරණ උපයෝජනය සඳහා ක්‍රියාමාර්ගගත

	නොතිබුණි. පරිගණක විද්‍යාගාරයේ පවතින CPU 23ක්, හා Monitor 26ක් හා UPS 39ක් හා ලිබඩු උපකරණ නිෂ්කාර්යව පැවතුණි.	අංශය අධිකරණ අමාත්‍යාංශය පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට යෝජනා වී ඇති අතර, ඉදිරියේ දී පරිගණක විද්‍යාගාරයක් එහි ස්ථාපිත කිරීමට හා නිශ්කාර්යව පවතින පරිගණක උපාංග භාවිතා කිරීමට අපේක්ෂිත ය. තව ද, 35009871A දරන CPU යන්ත්‍රය ගබඩාවට භාර දී ඇති අතර, එය පරීක්ෂා කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය වෙත භාරදීමට කටයුතුකර ඇත. එය භාවිතා කළ හැකි තත්ත්වයේ පවතී නම් CPU යන්ත්‍රයක අවශ්‍යතාවයක් ඇති අංශයකට ලබාදීමට කටයුතු කරනු ඇත.	යුතු ය.
(ආ)	යතුරු පැදියක් හා ත්‍රීරෝද රථයක් අපහරණය කිරීම සඳහා යෝජනාකර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.	WPQB 2005 ත්‍රීවීල් රථය මාතර මහේස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද රථයක් වන අතර, 2014.08.26 දින සිට මාතර මහේස්ත්‍රාත් විසින් මෙම අමාත්‍යාංශයේ භාවිතයට ලබා දී ඇත. අපහරණය කිරීමට පෙර මෙහි ලියාපදිංචි සහතිකයේ අනුපිටපතක් ලබාගත යුතු අතර, ඒ සඳහා වන ඉල්ලීම මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත යොමුකළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. WPMO 2024 යතුරු පැදිය පිළිබඳව භෞතිකව මෙන්ම ලේඛනමය වශයෙන් පරීක්ෂා කරමින් පවතින අතර, පවතින අඩුපාඩු සොයා බලා සම්පූර්ණකර ගැනීමෙන් අනතුරුව අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

(ඇ)	කැබ්රථයක් අනතුරට පත් වී වසර 06කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, මෙම රථයේ වැසි අංකය හා එන්ජින් අංකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත හා නොගැළපීම හේතුවෙන් මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු සිදුකරමින් පවතී. එම විමර්ශන කටයුතු ආරම්භකර වසරකට අධික කාලයක් ගත වී තිබුණ ද, අවසන්කර නොතිබුණි.	PA 5045 දරන රථයේ භෞතික පරීක්ෂාව සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය පිළිබඳව දැනුවත්කරන ලෙස ඉල්ලා මෝටර් රථ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විමර්ශන වෙත යොමුකර ඇත. ඒ සම්බන්ධව පිළිතුරු ලැබී නොමැති බැවින්, නැවත සිහිකැඳවීම් යොමුකර විමර්ශන කටයුතු අවසන්කිරීමත් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීමත් කරනු ලැබේ.	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ඈ)	ජනාධිපති කාර්යාලය, ධීවර අමාත්‍යාංශය හා අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 04ක් ද ඇතුළත්ව ආයතන 06ක් සඳහා වාහන 12ක් ලබා දී තිබුණු අතර, ඒවා නැවත පවරාගැනීමට හෝ එම ආයතනවලට පැවරීමට කටයුතුකර නොතිබුණි.	මේ පිළිබඳව තොරතුරු සොයාබලා අමාත්‍යාංශයේ අනුමැතියක් මත එම වාහන භෞතිකව භාර දී ඇති ආයතන වෙතම පවරා ඉදිරි කටයුතු කිරීමට නියමිත ය.	අදාළ වාහන පවරාගැනීමට හෝ පවරාදීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	අධිකරණ අමාත්‍යාංශය විසින් භුක්ති විඳින නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි හෙක්ටයාර් 0.2023ක් වූ ඉඩම, රක්වාන සංචාරක බංගලාව පිහිටි රූඩ් 01 පර්චර්ස් 10ක් වූ ඉඩම, බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි හෙක්ටයාර් 0.1760ක් වූ ඉඩම හා අධිකරණ පියස ඉදිකරන BCC ලංකා සමාගමට අයත් හෙක්ටයාර් 2.4281 (අක්කර 06) ඉඩම් පවරාගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ ද අවසන්කර නොතිබුණි**.**	ඉදිරි කටයුතු පිළිබඳ පසුවිපරම් කරනු ලබන බව දන්වා තිබුණි.	ඉඩම් පවරාගැනීමේ කටයුතු අවසන් කිරීම කළ යුතු ය.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව හා රජයේ නිලධාරින්ගේ ඇපආඥා පනත හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති 01/2011 චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් 12දෙනෙකු 2024 දෙසැම්බර් 31 දින වන විට ඇපතබා නොතිබුණි.	මෙම අමාත්‍යාංශයේ ඇප නොතැබූ නිලධාරින්ගේ ඇප තැබීමේ අයදුම්පත් 2024.10.13 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතු ය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කැබ්රථයක් 2020 ජනවාරි 17 දින අනතුරකට ලක්වී තිබුණු අතර, 2021 නොවැම්බර් මස ඉදිරිපත් කරන ලද මුදල් රෙගුලාසි 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව අනුව රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූරණය නොකරන ලද රු.218,175ක හිඟ මුදල රියදුරුගෙන් අයකර ගැනීමට නිර්දේශකර තිබුණ ද, එය අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	මේ පිළිබඳව පසුවිපරම් සිදුකර අලාභ අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිලධාරින් දැනුවත්කර ඇත.	පසුවිපරම් කටයුතු කඩිනමින් නිමකර අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2024 අප්‍රේල් 09 වන දින WPPH 1288 දරන රථයේ ඉදිරිපස අංක තහඩුව අස්ථානගතවීම සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාවක් 2024 අප්‍රේල් 10 දින ඉදිරිපත්කර තිබුණ ද, අවසන් වාර්තාව විගණිත දින වන විටත් නිකුත්කර නොතිබුණි. තව ද, මෙම කැබ්රථය 2024 අගෝස්තු 26 දින ද අනතුරකට ලක්වී තිබුණි.	මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කරන ලෙස අදාළ නිලධාරින් දැනුවත්කර ඇති බව.	අලාභ හානි පිළිබඳව විමර්ශන සිදුකිරීම හා වාර්තාකිරීම සිදුකළ යුතු ය.

(ඇ)	සමෘද්ධි මූල මණ්ඩල විසින් සමාලෝචිත වර්ෂය තුළ විසඳීමට තිබූ මුළු ආරවුල් සංඛ්‍යාව වූ 233,648ක් වූ අතර, එයින් නිරවුල්කර සහතික නිකුත්කළ මුළු ආරවුල් සංඛ්‍යාව 67,044ක් විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 29ක් වැනි පහළ මට්ටමක පැවතුණු අතර, ඉන් නඩු කැඳවීම් කරන පාර්ශවකරුවන් නොපැමිණීම නිසා නිරවුල් නොකිරීම සිදුකළ ආරවුල් සංඛ්‍යාව 91,083කි.	සමෘද්ධිකරණ ක්‍රමවේද පිළිබඳව මහජනතාවගේ නොදැනුවත්භාවය මේ සඳහා හේතු වී ඇති බවට හඳුනා ගන්නා ලද අතර, සමෘද්ධිකරණය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය සහ විශ්වාසය වර්ධනය කිරීම සඳහා ප්‍රජා දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහ වැඩසටහන් නිලධාරින් හරහා රාජ්‍ය නිලධාරින් හා ප්‍රජා දැනුවත්කිරීම් සිදුකරනු ලබන බව.	ආරවුල් විසඳීම කඩිනම් කළ යුතු අතර, සමෘද්ධිකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ඈ)	සමෘද්ධි මූල මණ්ඩල කොමිෂන් සභා රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ පැමිණීම පිළිබඳ පරීක්ෂාවේ දී එහි එක් සාමාජික මහතෙකුගේ සහභාගීත්වය අවම මට්ටමක පැවතුණි. 2024 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පවත්වා තිබුණු රැස්වීම් 33න් රැස්වීම් 04කට පමණක් සහභාගී වී තිබූ අතර, රු.25,000 බැගින් වූ මාසික දීමනා මාස 04ක් වෙනුවෙන් ලබාගෙන තිබුණි.	මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග ද සාකච්ඡා කරන ලද අතර, මෙම දීමනාව රැස්වීම් වාර සඳහා සහභාගීත්ව දීමනාවක් (Sitting Allowance) ලෙස සංශෝධනය කිරීමට යෝජනා විය. ඊට අදාළව ඉදිරි කටයුතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි.	සාමාජිකයන් රැස්වීම් සඳහා සහභාගී කරවීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	සමෘද්ධි මූල මණ්ඩල 329 අතරින් 2024 ජූනි 30 දිනට පෙර ධූරකාලය අවසන් වී ඇති ගැසට් කරන ලද මූල මණ්ඩල 175ක් සඳහා විගණිත දින වන විටත් පත්කිරීම් සිදුකර නොතිබුණි. මේ අතරින් සමෘද්ධි මූල මණ්ඩල 72ක ධූරකාලය අවසන් වී වසර 03කට වැඩි කාලයක් ගතවී තිබුණි.	2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් ලබාදෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම (රුපියල් මිලියන 25ක් ඉල්ලුම්කළ නමුත්, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 0.5ක් පමණක් වෙන් වී තිබුණි.) මත අපේක්ෂා කළ පරිදි සමෘද්ධිකරණයේ දක්ෂතා සහ උපක්‍රම පිළිබඳව පස්දින පුහුණු වැඩමුළු පැවැත්වීමට නොහැකි වූ අතර, එබැවින් නව සාමාජිකයන් වෙත පත්වීම් ලබාදීම ප්‍රමාද වී ඇත.	සමෘද්ධි මණ්ඩල පිහිටුවීම හා සාමාජිකයන් පත් කිරීම් කඩිනමින් කළ යුතු ය.
(ඊ)	වැඩ තහනම් කළ නිලධාරින් 04දෙනෙකුගෙන් හා සේවය හැරගිය නිලධාරින් 02දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.695,221ක් වූ ණයශේෂ වසර 05කට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි.	වැඩ තහනමට ලක් වූ නිලධාරින් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව ද, සේවය හැර ගිය නිලධාරින් දෙදෙනාගේ ණය සම්බන්ධ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව දක්වා තිබුණි.	ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඵ)	යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලය එක්රැස් කිරීමේ ටැංකි 3000ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම් අත්සන් නොකිරීම මත රුපියල් මිලියන 160ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මේ වන විට ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණ ද, එහි භෞතික ප්‍රගතිය සියයට 22ක් වැනි අඩු මට්ටමක පැවතුණි.	ඉන්දියානු රජය විසින් මූල්‍යනය කරනු ලබන මෙම ව්‍යාපෘතියේ දෙරට අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් කාලය නිමාවීමත් සමග මෙතෙක් දීර්ඝකර නොමැත. මේ සඳහා අවබෝධතා ගිවිසුම දීර්ඝකිරීම පිළිබඳව කටයුතු සාකච්ඡා මට්ටමේ පවතී. කෙසේ වුව ද, මෙය රාජ්‍යයන් 02ක් අතර ගිවිසුමක් බැවින් කඩිනමින් ඉදිරි කටයුතු සිදුකිරීම ජාතික ඒකාබද්ධතා අංශය වෙතින් සිදුකරනු ඇත.	සැලසුම් කළ කාර්යයන් නිසිපරිදි නිමකිරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ඵා)	රුපියල් මිලියන 300ක විදේශ ප්‍රදානය හා රු.500,000ක විදේශ මූල්‍යකරණය මගින් සමන්විත වූ නව සමාජ ඒකාබද්ධතා ව්‍යාපෘති යෝජනාව අනුමත නොවීම හේතුවෙන්, අමාත්‍යාංශය සමග ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම අත්සන්කර නොතිබුණි.	එම ව්‍යාපෘති යෝජනාව අනුමත නොවීම නිසා ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම අත්සන්කර නොමැත.	සැලසුම් කළ කාර්යයන් නිසිපරිදි නිමකිරීමට කටයුතු කළ යුතු ය.